

# ආකර්ෂණයෙන් තොර ගෝලීයකරණය

ආර්ථිකය ගැන සඳහන් කරද්දී ගෝලීයකරණය 1990 දසකයේ දී නිතර සාකච්ඡාවට ලක් වූ මාතෘකාවක් විය. එකල ගෝලීයකරණය සලකන ලද්දේ අනාගත ලෝක ආර්ථික වර්ධනයේ ලොකු ම බලවේගය ලෙසිනි. ගෝලීයකරණය නිසා ඇතැම් විශාල බහු ජාතික සමාගම් සමහර කුඩා රටවලට වඩා බලවතුන් වන බවට එදා අනාවැකි පළ විය.

**සී.පී. කුරුප්පු**

එහෙත් අද තත්ත්වය එදාට වෙනස් ය. යුරෝපීය සංගමය, ඇමරිකාව සහ චීනය වැනි රාජ්‍යවල බලය අද එදාට වඩා ශක්තිමත් ය. ගෝලීයකරණයේ ආකර්ෂණය අද දියවී යමින් පවතී.

ගෝලීයකරණ වැඩ පිළිවෙළ එදා සැලසුම් කරන ලද්දේ තිරයෙන් පිටුපස සිට ලොව ධනවත් රටවල ආර්ථිකයන් මෙහෙවන බහු ජාතික සමාගම් සහ එම සමාගම්වලට ආධාර කරන ආණ්ඩු මඟිනි. එම සමාගම් සහ ආණ්ඩු ඒ වැඩ පිළිවෙළ මෙහෙයැවීමට යොදා ගන්නා ලද්දේ ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල වැනි ලෝකයේ බලවත් ආර්ථික සංවිධානයි.

ලොව විශාලතම යකඩ සහ වානේ නිෂ්පාදකයා වන ජර්මනියේ තයිසන් කෘප්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ගර්හාඩ් ජුස් ගෝලීයකරණය හඳුන්වා දුන්නේ මෙසේ ය. "පසුගිය වසර කිහිපය තුළ ලෝක ආර්ථිකය විශාල ව්‍යුහමය වෙනස්කම් රැසකට භාජනයවී ඇත. මින් වසර කිහිපයකට ඉහත දී සිතා ගැනීමටවත් නොහැකි වූ ලෙස, භාණ්ඩ සේවා සහ මූල්‍ය සම්පත් අද රටින් රට හුවමාරු වෙමින් පවතියි.

ලෝක ආර්ථිකයේ අංශ රැසක් ම අද ලොව පුරා පැතිරී ගිය ජාලයක් තුළ ඒකරාශීවී ඇති අතර වෙළෙඳ පොළ කොටස්වල අයිතිය සඳහා අන්තර්ජාතික වශයෙන් ප්‍රබල තරගයක් පවතී. අප මෙය හඳුන්වන්නේ ගෝලීයකරණය යනුවෙනි."

අද ඇතිවී තිබෙන්නේ අන්තර්ජාතික සමාගම්වල තරගය අඩුවී ගොස් රාජ්‍යවල බලය යළි ශක්තිමත් වීම ය.

හොඳ ම උදාහරණය චීනය යි. එරට කාර්මික සැකැසුම් සහ සේවක අයිතිවාසිකම් සුරැකීමේ නීති රීති ආර්ථිකය කෙරෙහි රාජ්‍ය බලය තහවුරුකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රබල කාර්යයක් ඉටු කරයි. රාජ්‍යයන් තම ආර්ථිකයන්ට මැදිහත්වී කටයුතු කිරීම් අද එදාට වැඩියෙන් දැක ගත හැකි ය. මෙම තත්ත්වය ඇතිවීමට 1997-1998 කාලයේ පැවැති ආසියා මූල්‍ය අර්බුදය බෙහෙවින් බලපෑවේ ය. එම අර්බුදය සමයේ මැලේසියා රජය තම ආර්ථිකය අද වැටීමෙන් වළක්වා ගැනීමට මැදිහත්වී ක්‍රියා කළේ ය. මැලේසියාවේ එම කාර්යය මූල්‍ය අර්බුදය පැවැති අනෙක් ආසියා රටවල් වූ තායිලන්තයට සහ ඉන්දුනීසියාවට ආදර්ශ සැපැයී ය. චීනය එම අර්බුදයට ගොදුරු නොවූයේ එරට පැවැති දැඩි මූල්‍ය පිළිවෙත් නිසා ය.

අන්තර්ජාතික ධනවත් පන්තියක් විසින් ලෝක ආර්ථිකය මෙහෙයවනු ඇතැයි එදා විශ්වාස කරන ලදී. එම ධනවතුන් ලෝක ආර්ථිකය මෙහෙයැවීමට එදා යොදා ගත් සුක්කානම වූයේ ගෝලීයකරණය යි. ඇමරිකාවේ බිල් ක්ලින්ටන් පරිපාලනය සමයේ ලෝක ධනවතුන්ගේ පැලැන්තිය සිතුවේ ලෝක ආර්ථිකය මෙහෙයැවීමේ දී තමන් අනෙක් අයට ඉදිරියෙන් සිටින බවයි. ජනාධිපති ජෝර්ජ් බුෂ් බලයට පත්වීමෙන් පසු තත්ත්වය වෙනස්විය. බුෂ්ට ආධාර කරන දක්ෂිණාංශික කොටස්වලට අවශ්‍ය වන්නේ ආර්ථිකයට බලපෑම් කරන රාජ්‍ය පිළිවෙතකි. බුෂ් පරිපාලනය එය මැනවින් ඉටු කරයි. මේ අතර ලොව ජාතික රාජ්‍යයන් ද අද, එදාට වඩා බලවත් ය. අද ඇත්තේ ආර්ථික බලවතුන් වීම පිණිස එවැනි රටවල් අතර තරගයකි.

ගෝලීයකරණය කෙරෙහි දැඩි විශ්වාසයක් පැවැති සමයේ ලෝක ආර්ථිකය රඳවන මුදුන් කණු ලෙස බොහෝ දෙනා සලකනු ලැබුවේ ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල සහ ලෝක වෙළෙඳ සංවිධානය යි. එහෙත් අද එම ආයතනවල තත්ත්වය එදා තරම් යහපත් නැත. අන්තර්ජාතික මූල්‍ය අරමුදල අද බංකොලොත් වෙමින් පවතී. ආසියා මූල්‍ය අර්බුදය සමයේ ඇද වැටීමට පටන් ගත් එම අරමුදලෙන් දියුණු වන ඇතැම් රටවල් දැන් ණය ලබා ගන්නේ නැත. ලබාගෙන ඇති ණය නියම කලටත් පෙර ගෙවා දැමූ ඒ රටවල් එම අරමුදලෙන් යළි කවදාවත් ණය ලබා ගන්නේ නැති බව පවසති. අරමුදලේ මූල්‍ය ශක්තිය රැඳී ඇත්තේ එයට ලැබෙන පොලිය මත බැවින් පොලිය ලැබීම නැවැතීයෑමත් සමඟ එහි ශක්තිය අද නැතිවී ගොසිනි.

ලෝක බැංකුව පවසන්නේ බැංකුව සංවර්ධනය වන රටවලට සපයන ණය මුදල් නිසා ඒ රටවල් දියුණු වන බව යි. එහෙත් ලෝක බැංකුවෙන් ණය ලබා ගෙන දියුණු වූ රටක් නැති තරම් ය. සිදුවී ඇත්තේ බැංකුවෙන් ණය ලබා ගත් රටවල් තවත් දුප්පත් වීම පමණි. බැංකුව දැන් විශ්වසනීයත්වය පිළිබඳ අර්බුදයකට අද මුහුණපා සිටියි. වෙනිසියුලාවේ ජනාධිපති හියුගෝ චාවේස් එම සංවිධානය දෙකෙන් ම තම රට පසුගියදා ඉල්ලා අස්කර ගත්තේ එම සංවිධාන දෙකෙන් ම පලක් නැති බව ලොවට කියාපාමිනි. තවත් රටවල් කිහිපයක් ම වෙනිසියුලාව ගිය මඟ යෑමට සූදානමෙන් සිටියි.

ලෝක වෙළෙඳ සංවිධානයේ අර්බුදය ද බරපතල එකකි. කටාර්හි දෝහා හි දී පසුගියදා පැවැති එම සංවිධානයේ මහ සමුළුව තීරණයකින් තොරව අවසන් වූයේ අමරිකාව තම රටේ ගොවියන්ට ලබා දෙන විශාල සහනාධාර කපා හැරීම ප්‍රතික්ෂේප කිරීම මුල් කරගෙන යි.

ලොව ලොකු ම ආර්ථික බලවතා වන ඇමරිකාවේ දෙබිඩි එසේත් නැත්නම් කුහක වෙළෙඳ පිළිවෙත ද ගෝලීයකරණයට අවහිරයක්වී තිබේ. ජනාධිපති ක්ලින්ටන් ගේ කාලයේ දී ඇමරිකාවේ නිදහස් වෙළෙඳාම ඉදිරියට ගියත් බුෂ් පාලනය යටතේ සිදු වන්නේ නිදහස් වෙළෙඳාම ගැන කතා කරමින් ආරක්ෂණවාදයත් ක්‍රියාත්මක කිරීම යි.

ගෝලීයකරණය ගැන ලබාදෙන ප්‍රතිඥාත් නිදහස් වෙළෙඳාමෙන් ලැබෙන ප්‍රතිලාභ අතර ලොකු පරතරයක් පවතී. එක් එක් රටවල ඇති ආර්ථික අසමානකම් ආර්ථික මට්ටම්වල පරතරය සහ ඇතැම් රටවල පවතින දිළිඳුකම ද ගෝලීයකරණයේ ඉදිරි ගමනට ඇති බාධාවන් ය.

ගෝලීයකරණයට විරුද්ධව නැඟෙන පොදුජන උද්ඝෝෂණ ද අවතක්සේරු කළ යුතු නැත. මුල දී ගෝලීයකරණයට එරෙහිව නැඟුන උද්ඝෝෂණ පසුව යුද විරෝධී උද්ඝෝෂණ ලෙස වර්ධනය විය. මෙක්සිකෝවේ කැන්කුන් නගරයේ දී 2003 දී පැවැති ලෝක වෙළඳ සංවිධානයේ සමුළුව කඩාවැටීමත්, හොංකොංහි දී 2005 දී පැවැති සමුළුවේ දී අර්බුද මතුවීමත්, ගෝලීයකරණයට පක්ෂපාත යුරෝපීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රංශ සහ ඕලන්ද ජනතාව විසින් ප්‍රතික්ෂේප කිරීමත් ගෝලීයකරණ මඟ හරස් කර දමන ලද මාර්ග බාධකයන් ය.

ගෝලීයකරණ වැඩ පිළිවෙළ අද දුර්වලවී ඇතත් එය මුලින් ම ප්‍රතික්ෂේපවී නොමැත. බොහෝ රටවල් එම වැඩ පිළිවෙළ තවමත් ක්‍රියාත්මක කරන්නේ ගෝලීයකරණයට විකල්පයක් තවමත් ඉදිරිපත්වී නැති බැවිනි. ලෝක වෙළෙඳ සංවිධානයේ කටයුතු හරියාකාරව සිදු නොවන බැවින් ලොව ධනවත් රටවල් සංවර්ධනය වන රටවල් සමග මෑතක සිට නිදහස් වෙළෙඳ, ආර්ථික සහයෝගීතා වැනි ද්විපාක්ෂික ගිවිසුම් අස්සන් කිරීමට පටන් ගෙන ඇත. එහෙත් බහු ජාතික සමාගම්වල සහ එම


> ලොව ලොකු ම ආර්ථික බලවතා වන ඇමරිකාවේ දෙබිඩි එසේත් නැත්නම් කුහක වෙළෙඳ පිළිවෙත ද ගෝලීයකරණයට අවහිරයක්වී තිබේ. ජනාධිපති ක්ලින්ටන් ගේ කාලයේ දී ඇමරිකාවේ නිදහස් වෙළෙඳාම ඉදිරියට ගියත් බුෂ් පාලනය යටතේ සිදු වන්නේ නිදහස් වෙළෙඳාම ගැන කතා කරමින් ආරක්ෂණවාදයත් ක්‍රියාත්මක කිරීම යි. ගෝලීයකරණය ගැන ලබාදෙන ප්‍රතිඥාත් නිදහස් වෙළෙඳාමෙන් ලැබෙන ප්‍රතිලාභ අතර ලොකු පරතරයක් පවතී.


සමාගම්වලට සහයෝගය දෙන ධනවත් රටවල අනාගත බලාපොරොත්තු සිතන තරම් ලෙහෙසියෙන් දිනා ගැනීමට නුපුළුවන. ධනවත් රටවලටත් බහු ජාතික සමාගම්වලටත් විරුද්ධ බලවේග දැන් යළිත් පෙළ ගැසෙමින් සිටියි. දකුණු ඇමරිකාව හරහා එවැනි බලවේගවල රැල්ලක් දැනටමත් හමා යමින් පවතියි. දකුණු ඇමරිකාවේ රටවල් රැසකම මෑත දී බලයට පත් සමාජවාදී නායකයෝ එම බලවේගයට නායකත්වය දෙති. මෙම බලවේග මීට වසර විස්සකට පෙර බිහිවූයේ නම් ඇමරිකාව ප්‍රධාන ධනවාදී රටවල් එම බලවේග හඳුන්වනු ඇත්තේ නව කොමියුනිස්ට්වාදය ලෙසිනි. එම බලවේග ක්‍රියාත්මක කරන නායකයෝ නව කොමියුනිස්ට්වාදීහු වෙති. එහෙත් අද එවැනි නම් අඩ ගැසීම සිදු නොවෙයි.

ගෝලීයකරණයත් ලෝක බැංකුව වැනි අන්තර්ජාතික ආර්ථික සහ ණය දෙන ආයතනවලත් ක්‍රියාකාරිත්වය දුර්වලවීමෙන් අපට ඉගෙන ගත හැකි ලොකුම පාඩම වන්නේ අනුන් ඉදිරිපත් කරන ආර්ථික උපදෙස්වලට යට නොවී අපේ රටේ ප්‍රශ්නවලට ගැලපෙන අපට සුදුසු ආර්ථික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම ය. මහින්ද චින්තනය තුළ එම පිළිවෙත් නියම අයුරින් සටහන්වී තිබෙනවා පමණක් නොව ඒවා ඒ අයුරින් ම ක්‍රියාත්මක වන බව ද දැක ගත හැකි ය. ❑